අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
චක්‍රලේඛ අංකය : 1995/16

මගේ අංකය : 2/පාය/4/72
අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1996.06.09 වන දින.

සියලුම රජයේ සහ පෞද්ගලික පාසල්වල
විදුහල්පතිවරු වෙත

## 5 වෙනි වසරේ ශිෂ්‍යත්ව විභාගය - 1995

5 වෙනි වසරේ ශිෂ්‍යත්වයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති සියළුම සිසුන්ට එම විභාගයට පෙනී සිටීමට ඉඩ දීම සෑම පාසලකම විදුහල්පති මහත්ම මහත්මියකගේ ම වගකීම බව අවධාරණය කරනු කැමැත්තෙමි. මෙම තීරණය සෑම රජයේ පාසලකම විදුහල්පති මහත්ම මහත්මීන්ට මෙන්ම අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය අනුමත කර ඇති සියළුම පෞද්ගලික විදුහල්වල විදුහල්පතිවරුන්ට ද අදාලය.

1994 වර්ෂය දක්වා මෙම විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන, සුදුසුකම් ඇති සෑම ළමයෙකුට ම මෙම අවස්ථාව ලැබී ඇත. එහෙත්, සමහර පාසල් 1995 දෙසැම්බර් මාසයේ පැවැත්වෙන විභාගයට ළමුන් ඉදිරිපත් නොකිරීමට තීරණය කර ඇති බව මෙම අමාත්‍යාංශය වෙත පැමිණිලි ලැබී ඇත. සමහර පාසල් බලධාරීන් මෙබඳු තීරණයක් ගෙන තිබේනම්, එය අසාධාරණ, සිසුන්ගේ අයිතිවාසිකම්වලට හානි වියහැකි තීරණයක් බව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය කල්පනා කරයි. ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත, එම විභාගයෙන් සමත් වන සිසුන්ට විවිධ ප්‍රතිලාභ ලැබෙන බැවින්, එබඳු අවස්ථාවක වැළැක්වීම කිසිසේත් ම යුක්තිසහගත නොවන බව අමාත්‍යාංශයේ පිළිගැනීමයි. මෙම විභාගයට පෙනී සිටීමට අදහස් කරන, ඒ සඳහා සුදුසුකම් තිබෙන සෑම දරුවකුට ම දෙසැම්බර් මාසයේ පැවැත්වෙන විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි ඔවුන්ගේ ඉල්ලුම්පත් විභාග කොමසාරිස් ජනරාල්තුමා වෙත යවන ලෙස සෑම විදුහල්පති මහත්ම මහත්මියකුටම මෙයින් දන්වමි.

මෙම තීරණය රජයේ පාසල් වලට මෙන්ම පෞද්ගලික පාසල් වලට ද එකසේ අදාල බව අවධාරණය කරන අතර, සෑම පෞද්ගලික පාසලක්ම අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

අ. ක/
එම්. ඩී. පීරිස්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ
ලේකම්

පී. ජී. දයාරත්න
අතිරේක ලේකම් (අධ්‍යාපන සංවර්ධන)

පිටපත්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා කළාපීය අධ්‍යාපන අධ්‍යක්ෂවරු
(ඔබ පළාතේ/ කළාපයේ ඇති සියළුම පෞද්ගලික සහ රජයේ පාසල් මගින් මෙම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා.)